පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ව්‍යාපාර කටයුතු

සතිය : 5

6 ශ්‍රේණිය

සකස් කිරීම :

## 'සොයමු අපි භාණ්ඩයක ද්‍රව්‍යය වියදම පමණක්'

**නිම කළ භාණ්ඩයක අඩංගු ද්‍රව්‍යය විමසා බැලීම.**

භාණ්ඩයක් නිපදවීමට විවිධ ද්‍රව්‍යය අවශ්‍ය වේ. යම් භාණ්ඩයක් නිපදවීමට වැය කරන වියදම් වලින් වැඩිම ප්‍රමාණයක් දරනු ලබන්නේ එම භාණ්ඩයේ අඩංගු ද්‍රව්‍යය සඳහාය.උදාහරණ ලෙස ඔබේ නිල ඇඳුම සැකසීමට යොදාගෙන ඇති ද්‍රව්‍යය පහත දැක්වේ.

- **රෙදි**
- **නූල්**
- **බොත්තම්**
- **සැන ගාන්චු**

1. පහත එක් එක් භාණ්ඩ නිපදවීමට යොදාගෙන ඇති ද්‍රව්‍යය මොනවාදැයි වෙන් වෙන්ව ලැයිස්තුගත කරන්න.

- ➢ කේක්
- ➢ ලී මේසයක්
- ➢ සිමෙන්ති ගල්
- ➢ එළවළු රොටී
- ➢ බෙරයක්

2. භාණ්ඩයක අඩංගු ද්‍රව්‍යය සඳහා යන වියදම් අවම කරගත හැකි ආකාර පහක් ලියන්න

**<u>භාණ්ඩයක ද්‍රව්‍යය වියදම ගණනය කිරීම.</u>**

ද්‍රව්‍යය සඳහා වූ වියදම භාණ්ඩයක නිෂ්පාදන වියදම තීරණය කරන ප්‍රධානම සාධකය කි. ඒ අනුව පහත උදාහරණය ආශ්‍රයෙන් භාණ්ඩයක ද්‍රව්‍යය වියදම ගණනය කරන ආකාරය සලකා බලමු.

උදා; අත් බෑග් 100 ක් සෑදීමට අවශ්‍යය ද්‍රව්‍යය ලැයිස්තුව පහත දක්වේ. ඒ අනුව අත් බෑගයක් සඳහා වැය වන ද්‍රව්‍යය වියදම ගණනය කරන්න.

| අවශ්‍යය ද්‍රව්‍යය | ප්‍රමාණය | මුදල |
|---|---|---|
| මුද්‍රිත රෙදි | මීටර් 50 | රු. 10000.00 |
| නූල් | පන්දු 5 | රු. 1000.00 |
| බොත්තම් | 200 | රු. 1000.00 |
| මුළු ද්‍රව්‍යය වියදම | | රු. 12000.00 |

$$\textbf{එක් ඒකකයක වියදම} = \frac{\textbf{මුළු ද්‍රව්‍යය වියදම}}{\textbf{ඒකක ගණන}}$$

$$\text{අත් බෑගයක ද්‍රව්‍යය වියදම} = \frac{12000.00}{100}$$

$$= \text{රු. } 120.00$$

1. පැන්සල් 100 ක් සෑදීමට අවශ්‍යය ද්‍රව්‍යය ලැයිස්තුව පහත දක්වේ. ඒ අනුව පැන්සලක් සඳහා වැය වන ද්‍රව්‍යය වියදම ගණනය කරන්න.

| | |
|---|---|
| ලී කැබලි 100 | ලී කැබැල්ලක් රු. 2.00 |
| මිනිරන් කුරු 100 | කුරක් රු.4.00 |
| තහඩු පටි මීටර් 2 | මීටර් එකක් රු.100 |

2. වෙළෙඳපොළේ ඇති විවිධ වර්ගයේ පැන්සල් වල මිල ගණන් සොයා බලන්න. ඒවායේ මිල ගණන් එකිනෙකට වෙනස් වීමට හේතු මොනවාදැයි සිතා බලන්න.

3. කේක් කිලෝග්‍රෑම් 10 ක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍යය ලැයිස්තුවක් පහත දැක්වේ.

| | |
|---|---|
| පාන්පිටි කිලෝග්‍රෑම් 3 | කිලෝග්‍රෑම් එකක් රු. 100 |
| මාගරින් කිලෝග්‍රෑම්3 | කිලෝග්‍රෑම් එකක් රු. 1000 |
| සීනි කිලෝග්‍රෑම් 3 | කිලෝග්‍රෑම් එකක් රු. 150 |
| බිත්තර 40 | එකක් රු.20.00 |
| බේකින් සෝඩා ග්‍රෑම් 200 | ග්‍රෑම් 100 ක් රු.150 |
| වැනිලා මිලි ලීටර් 30 | මිලි ලීටර් 10 ක් රු. 40 |

i . කේක් කිලෝග්‍රෑම් 10 සෑදීමට යන මුළු ද්‍රව්‍යය වියදම සොයන්න.

ii. කේක් කිලෝග්‍රෑම් එකක් සෑදීමට යන ද්‍රව්‍යය වියදම සොයන්න.

iii .වෙළෙඳපොළේ ඇති විවිධ වර්ගයේ කේක් වල මිල ගණන් සොයා බලන්න.